## කවරයට වැඩි යමක්...

# ලිබරල් හොල්ලන් බ්‍රික්ස් එනවෝ

බටහිරට ලිබරල් මොඩලයට සදාකාලික ගිම්හානයක් හමා එන ලකුණු දැනෙන්නට පටන් ගෙන තිබේ. ධනවාදය ගිය දුර ඕනෑවටත් වඩා වැඩි බව එහි ඇතිවූ අර්බුද සහ යොදන ලද පැලැස්තර කියාපාන්නේය. ඒ මාවතෙන් පිට පැනීම සඳහා සියලු සාධක සම්පූර්ණ වී ඇත්තේ වුවද ආකාර කිහිපයක බලහත්කාරය විසින් එය 'නොහෙල්ලුම්' බවට පත් කර ඇත්තේය. වෙනස සඳහා වූ සියලු උත්සාහයන් ඩොලරයේ ආධිපත්‍ය, අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රය විසින් සිර ගත කර ඇති මොහොතක, නව මංතීරුවක් වෙනස වෙනුවෙන් විවරව ඇත්තේය. ඒ වෙනසේ දහසය වෙනි එකමුතුව පසුගිය දා රුසියාවේ කසාන් හී දී මුළු දුන්නේය. ලෝකය තනි ධ්‍රැවීකරණයෙන් මුදාගැනීම එහි පළමු උත්සාහය වේ.

බ්‍රික්ස් මුළු දෙන මුඛ්‍ය අරමුණ වනාහි, බටහිර ආර්ථිකය සහ එහි දේශපාලනයෙන් එන්නා වූ වඩදිය ප්‍රවාහයට එරෙහි වූ බැම්මක් නිර්මාණය කිරීමය. ඩොලරයට සහ නව්‍ය ලිබරල්වාදයට වෙනස් වූ ලෝක මාවතක් ඉදිකිරිම සඳහා ද එය පදනම වනු ඇත.

බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, සහ දකුණු අප්‍රිකාව යන බ්‍රික්ස් එකමුතුවේ සව්බලය ලෝක ආර්ථිකයේ සැලකිය යුතු පංගුවකි. මේ සවිමත් බල මූලය සඳහා ලෝක ජනගහනයෙන් 41% ක් සහ ලෝක නිෂ්පාදනයෙන් 24% ක පංගුවක් ඇත්තාහ. ලෝක වෙළඳ කටයුතුහි, 16% ක් බලය ද එහි ගැබ්ව තිබේ.

එකට මුණගැසී, උඩුගං බලා පිහිනීමේ කටයුත්තට මේ බලමුළුව අත තැබීම, බටහිර පපුව අන් කවරකටද වඩා උණුසුම් කර තිබේ. බටහිර මාධ්‍ය, බ්‍රික්ස් විෂයෙහි පළකරන විරෝධාකල්පය සහ මේ එකමුතුව සැහැසි ලෙස බිඳ දැමීම සඳහා ලිබරල් උගතුන් මුදාහරින මතිමතාන්තර පමණක් දර්ශකයක් ලෙස භාවිත කළ කල්හි, එම වේදනාවේ ප්‍රමාණය මැනගත හැක්කේය.

2022 වසරේ ශ්‍රී ලංකාවට අදාළ ව, අපනයනවලින් 10.3% සහ ආනයනවලින් 47.3% යෙදුමක් බ්‍රික්ස් රටවලට තිබුණි. බ්‍රික්ස් රටවල් අපගේ ආර්ථික දේහය සඳහා ඒ ආකාරයේ බලපෑමක් සිදු කරන විභවයක ඇත්තේ නම්, එතැන් සිට අපේ කතාව සඳහා ද අලුත් කියැවීමක් විවර විය යුතුය. ලාංකේය දේශපාලනයේ පුනරුදය සමඟ බ්‍රික්ස් හි ගැළපීම කොතෙක්ද යන්න වියත තබා මැන බැලිය යුතු නැත. මේ වෙනස සමඟ එයට සමගාමී සම්බන්ධයක් තිබෙනවා නිසැකය.

ප්‍රවේශ අද සිය වේගය බවට, බ්‍රික්ස් කතිකාව පත් කරගන්නේ මේ ආදී කාරණා මුල් කරගෙනය.

බෙහෙවින් වෙනස් විදේශ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර අවශ්‍යතා ඇති රටවල් මේ ඈණියේ සිටින්නේය. දෙවනුව, ලෝක පාලනයේ පරිණාමය සඳහා එහි ඇති දායකත්වයය.

බ්‍රික්ස් යනු බටහිර ලිබරල්වාදී තිඹිරිගෙයින් බිහිවූ යමක් නොවේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ආරම්භ වන ලිබරල් ජාත්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පය, එක්සත් ජනපදයේ සහ බටහිර යුරෝපයේ විදේශ ප්‍රතිපත්ති හි පිනෝ කියෝ වන විට, බ්‍රික්ස් ඒ සඳහා වන පිළිතුර බවට පත්ව තිබේ. එය කියවා ගැනීම සඳහා වූ ප්‍රවේශ දරන ප්‍රවේශය මෙය වන්නේය.




මෙම කාටූනය සයිමන් රෙජිස් විසින් කාටුන් මුමන්ට් වෙබ් අඩවියේ පළ කරන ලද්දකි.




# බලවතුනට නතු නොවන දකුණේ සහයෝගය BRICS

BRICS යනු ලොව පවතින බටහිර ගැති ආර්ථිකය දේශපාලන බල ඒකාධිකාරයට විකල්පයක් ලෙස ගොඩනැගි සංවිධානයකි. එය ආරම්භ වූයේ 2001 වර්ෂයේදීය. මේ වන විට මෙය විසල් ජයග්‍රහණ අත්කර ගනිමින් වඩාත් ශක්තිමත් සංවිධානයක් බවට පත්වෙමින් සිටී.

BRICS හි ආරම්භය ගෝලීය අවශ්‍යතාවකි. ඊට ආසන්න හේතුවක් වූයේ අනාගත ආර්ථිකය පිළිබඳ පුරෝකථනයයි. ඒ පුරෝකථනයTerence James O'Neill නැමති බ්‍රිතාන්‍ය ආර්ථික විද්‍යාඥයා 2005 දී ඉදිරිපත් BRIC සංකල්පයයි. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව සහ චීනය එක්වූ කළ ඒ රටවල මුල් අකුරු එක්වී සැකසෙන කෙටි නාමය BRIC ය. මෙය ගෝලීය ආර්ථිකයේ G7 බලයට අභියෝග කරන බව James ගේ අදහසයි.

G7 යනු හතේ කණ්ඩායමේ රටවල් එකතුවයි. යුරෝපා සංගමයට අයත් ලොව ප්‍රමුඛ ආර්ථිකයන් සහිත රටවල් මෙහි සාමාජිකත්වය දරයි. කැනඩාව, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ජපානය, එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය එම රටවල්ය.

ලෝක බැංකුවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් වැඩි දායකත්වයක් දක්වන මෙම සමූහය ගෝලීය වෙළෙඳාම මෙන්ම ගෝලීය දේශපාලනය හසුරවන ප්‍රමුඛ බලඅධිකාරියයි.

මේ වන විට BRICS සාමාජිකයින් 9ක් ප්‍රමුඛව රටවල් ගණනාවකට සාමාජිකත්වය හා ආර්ථිකව සහයෝගයෙන් කටයුතු කරයි. BRICSහි ප්‍රමුඛයින් 9 මෙසේයි. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු අප්‍රිකාව, ඉරානය, ඊජිප්තුව, ඉතියෝපියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයයි. G7රටවල් හා BRICS පිළිබඳව සැසඳීමෙන් පෙනී යන්නේ BRICS සමූහය ගෝලීය ආර්ථිකයේ ප්‍රමුඛයින් බවට පත්වෙමින් සිටින බවයි.

පසු ගිය මස අවසන්වූ BRICS සමුළුව 2024 ව්‍යාප්තිය භූ දේශපාලනික ඇඟවුම් රාශියක් සමඟ පැමිණ ඇත්තකි. එය දකුණු අර්ධගෝලීය ආර්ථිකය මෙන්ම මේ රටවල් නියෝජනය කරන ජන විකාශනය නියෝජනය කරයි. BRICS රටවල් 9 ගෝලීය ආර්ථිකයෙන් හතරෙන් එකකට වඩා සහ ලෝක ජනගහනයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් සමන්විතය. ගාසා තීරයේ සහ යුක්රේනයේ යුද්ධ, ගෝලීය ආර්ථික පද්ධතියේ හැඩය, චීනය සහ බටහිර රටවල් අතර තරගය සහ පිරිසුදු බලශක්තිය වෙත පිවිසීමේ උත්සාහයන් කෙරෙහි බලපෑම් කිරීමට මෙම කණ්ඩායම සැලසුම් කරයි.

**G7 යනු හතේ කණ්ඩායමේ රටවල් එකතුවයි. යුරෝපා සංගමයට අයත් ලොව ප්‍රමුඛ ආර්ථිකයන් සහිත රටවල් මෙහි සාමාජිකත්වය දරයි.**

ඒ සඳහා තාක්ෂණික හා දැනුම් හුවමාරුව, වෙළෙඳ ගිවිසුම්, බලශක්ති හුවමාරුව සහ ප්‍රාග්ධන විසඳුම්, මෙන්ම ආයෝජන පුළුල් කිරීම් ආදී වශයෙන් සහයෝගිතාව පුළුල් කර තිබේ.

පසුගිය වසරේ චීනය BRICS සහයෝගිතා විශ්වවිද්‍යාලයක් ද පිහිටුවීය. BRICS විද්‍යා සහ නවෝත්පාදන උද්‍යානය නිල වශයෙන් Xiamen නගරයේ පිහිටුවා තිබේ. මෙම උද්‍යානය විස්තීර්ණ සේවා මධ්‍යස්ථානයක්, ප්‍රදර්ශන උද්‍යාන දෙකක් (Science City සහ Software Park Phase III) සහ විවිධ විශේෂිත උද්‍යාන ඇතුළත් කිරීමට සකසා ඇත. වර්ග මීටර් 200,000 මෙම උද්‍යානය ගොඩනගා තිබේ. BRICS රටවල් හරහා ප්‍රතිනිර්මාණය කළ හැකි අතිනවීන තාක්‍ෂණ සමාගම් සමූහයක් පෝෂණය කිරීම මින් අපේක්ෂා කරයි.

එසේම තවත් උදාහරණයකින් පැහැදිලි කළ හොත් යුක්රේන් යුද්ධය නිසා බටහිර රටවල් රුසියාවට ආර්ථික සම්බාධක පැනවූ අතර රුසියාවේ බොරතෙල් නිෂ්පාදනයේ ප්‍රමුඛ ගැනුම්කරුවන් බවට පත්වී ඇත්තේ චීනය සහ ඉන්දියාවයි. ශ්‍රී ලංකාවද BRICS සහයෝගිතාවේ සාමාජිකත්වය ඉල්ලා සිටි අතර පසුගිය BRICS සමුළුව නියෝජනය කළේ මෙරට විදෙස් කටයුතු ලේකම්වරියයි. ඇය අරුණි විජේවර්ධනය. අරුණි පසුගිය ඔක්තෝබර් 24 වැනි දින රුසියාවේ කසාන්හි පැවති BRICS සමුළුවේදී මෙසේ ඇමතුවාය.

"ශ්‍රී ලංකාව, BRICS සංවිධානයේ සහ නව සංවර්ධන බැංකුවේ සාමාජිකත්වය අයැදුම් කිරීම අපගේ ගෝලීය ව්‍යාප්තියේ වැදගත් අංගයක්.

අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් සහයෝගිතාව, සංවර්ධනය සහ ශක්තිමත් ආර්ථික තත්ත්වයක් ගොඩනැඟීම සඳහා වන අපගේ සාමූහික අභිලාෂය සාක්ෂාත් කර ගැනීමෙහිලා බ්‍රික්ස් සංවිධානය ඵලදායී හවුල්කාරිත්වයක් ලෙස අපි සලකමු.

ගෝලීය මූල්‍ය ව්‍යුහය ඇතුළු ගෝලීය පාලන ආයතන ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව වැදගත් ආරම්භක ලක්ෂ්‍යයක් ලෙස අපි සලකමු. බහුපාර්ශ්විකත්වයේ ව්‍යුහයන් තුළ සියලු විශාල සහ කුඩා රාජ්‍යයන්ටද හිමි විය යුතු ස්වෛරී සමානාත්මතාවේ වටිනා මූලධර්මය අපි පිළිගනිමු."

▶ **බුද්ධිකා බ්‍රාහ්මණගේ**



# ඉරේෂා නැගණියනි, නුඹ නැතැයි කියා මා කෙසේ කියන්න ද?

**ඒ 1986 වසරේ දෙසැම්බර් මාසයේ දවසක් බව නිසැකය. වියළි ගිම්හාන සමය ඇරඹී තිබුණේ නිල්ලෙන් වැසී ගිය ජ'පුර සරසවියෙහි තණ පත් ද දුඹුරු පැහැයට හැරෙමින් පැවතිණි. ඒ මගේ සරසවි දිවියෙහි දෙවන වසරේ ඇරඹුමයි. එදින මා සිටියේ තනිව ජිම් කැන්ටිම දෙසට යමිනි.**

හුදෙකලාවේ එක් තේක්ක ගසක් යට සිටිනා ඇය මා නෙත ගැටුණේ එසේ කැන්ටිමට ළංවෙමින් සිටි මොහොතෙහිය. දුටු මතින්ම ඇය වැලපෙමින් සිටි බව පැහැදිලි වූයෙන් මම ඇය වෙත ගියෙමි. පළමු වසර සිසුවියකට හුරු කෝල බව මුසු බියපත් බව විදහමින් ඇය ම දෙස බැලුවේ කඳුළින් පෙඟුණු මුහුණිනි.

'නංගි, ඇයි බං උඹ අඬන්නෙ?'

ඇය එවිට මට පැවසුවේ තමන් හට 'සීනියර් අයියා' කෙනකු බැණ වැදුණ බවයි.

' ඔහොම එක එකා බණින බණින පාරට අඬන්න ගියොත් උඹට මුළු ජීවිත කාලෙම අඬ අඬා ඉන්න තමයි වෙන්නෙ.' මම වගකට නොගෙන කීවෙමි. එවිට ඇය,

'ඒ අයියා මට අම්මා මතක් කරලයි බැන්නෙ. මගෙ අම්මා නෑ. කවුරු හරි මගෙ අම්මාව මතක් කරල බණින එක මට දරාගන්න බෑ.'

ඒ අප අතර දීර්ඝ කතාබහකට මුල පිරූ පිළිතුරයි. ඉන් මඳ වෙලාවක් යද්දී ඇය මට තම පෞද්ගලික ජීවිතයේ සැලකිය යුතු තොරතුරු ප්‍රමාණයක් කියා සිටියාය. තමන් හදවතෙහි රෝගී තත්ත්වයෙන් පසුවන බව පැවසූ ඇය, මව අහිමි ජීවිතයක කටුක බව මෙන්ම තම පවුල් පසුබිම ඇතුළු බොහෝ තොරතුරු කියා සිටියාය. ඒ දීර්ඝකාලීන මිතුදමක ඇරඹුමයි.

මම ඒ වන විට ද සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සාමාජිකයකු මෙන්ම පූර්ණකාලීනයකු ද වී හමාරය. කාලය වේගයෙන් ගෙවී යද්දී ඉක්මනින්ම අපි එකම අරමුණක් හඹා ගිය ගමන් සගයන් ලෙස බැඳුණෙමු. ඇය වේගයෙන් ප්‍රබල ශිෂ්‍ය ක්‍රියාකාරිනියක බවට පත්වූවාය. සෞඛ්‍යය අතින් ගත් කල ඇගේ හදවත රෝගී වුවද දේශපාලනික වශයෙන් ගත් කල ඒ අතිශය නිරෝගී හදවතක් බව ඇය ඉක්මනින්ම ඔප්පු කර සිටියාය. කෑගල්ලේ පොල්ගම්පල, ඉහළ සමාජ පසුබිමක උරුමක්කාරියව සිටි ඇය එසේ තම පවුල් පසුබිම එහෙම පිටින්ම අමතක කර පීඩිත මිනිසුන් වෙනුවෙන් අරගල බිමට අවතීර්ණව ජීවිත පරිත්‍යාගයෙන් වුව පොදු අරමුණ වෙනුවෙන් කැපවන්නට සපථ කළාය. විද්‍යා පීඨයෙහි අධ්‍යාපනය අතහැරදැමූ ඇය, ඉන්පසුව පූර්ණකාලීන සටන්කාරියක ලෙස තම ඉදිරි මග තෝරා ගත්තී, තවත් පක්ෂ සාමාජිකාවන් දෙදෙනකු සමඟින් එකම බෝඩිමක ලැගුම්ගෙන මහත් උද්‍යෝගයෙන් ඉදිරියෙහි එළඹීමට නියමිත හීම සමයක අසීරු පරීක්ෂණයන්ට මුහුණදෙන්නට සිත දැඩි කරගත්තාය.

ඒ මහ පාරේ දැවැන්ත උද්ඝෝෂණයන්ගේ සිට විවිධ සන්නද්ධ ක්‍රියාකාරකම් දක්වා ජවිපෙ දේශපාලන කටයුතු විහිදයමින් පැවති සමයයි. ඇය මේ මුළු කාලය පුරාම තමන් වෙත පවරන ලද කවර වගකීමක් වුව තමන්ගේ පෞද්ගලික ආරක්ෂාවට වඩා පොදු අරමුණෙහි වැදගත්කම පෙරට ගනිමින් ඉටු කරන්නට වගබලා ගත්තාය. ඉතාම සමීප යෙහෙළියක ලෙස පොදු සිසුන් අතරෙහි හැසිරුණු ඇය පක්ෂ සාමාජිකයන් අතරෙහි විශ්වාසවන්ත සටන්කාමිනියක බව යළි යළි සනාථ කර සිටියාය. අතිශය සංවේදී ඇය, අනෙකාගේ දුක හමුවේ සිය නෙත කඳුළින් තෙත් වන්නට හැරිය ද දේශපාලනයට බට දා පටන් තමන් වෙනුවෙන් එක කඳුළකුදු හැලුවේ නැත.

මේ අතර අප යළිත් හමු වූ රහසිගත අවකාශයක් ද එළඹිණි. ඒ ජවිපෙ සාමාජිකයන් උදෙසා සංවිධානය කරන ලද රහසිගත අධ්‍යාපන කඳවුරකි. ඒ කඳවුරු කාලය තුළ මට හමුවූවේ මැසිවිල්ලක තරම නොනඟා එහි පැවති සියලු දුෂ්කරතා දරාගත් දේශපාලන අධ්‍යාපනය ලැබීමෙහිලා නොනැසෙන අනුරාගයකින් යුත් අරගලකාරියකි.

මගේ සමකාලීන සගයකු වරක් කී පරිදි ඇය අපූරු දක්ෂතා ඇති කලාකාරියකි.

'ආරක්ෂාව ගැන හිතලා සමහර අවස්ථාවලදී අපි පක්ෂයේ කටයුතුවලට යන්නෙ පෙම්වතුන් දෙදෙනක් හැටියට. ඒ අවස්ථාවලදි එයා නියම පෙම්වතියක් හැටියට කරපු රඟපෑම අති විශිෂ්ටයි. ඒ වගේම පැනගන්න අමාරුම මුර කපොලුවලින් පැනගන්න එයා කරපු රඟපෑම ඉහළින්ම සාර්ථක වුණා. බයක ලකුණක්වත් නොතිබ්බ, එයා තුළ තිබ්බ ආත්ම විශ්වාසය අන්තිම ඉහළයි.'

ඇයට පක්ෂය වෙනුවෙන් තම පෙම පවා කැප කරන්නට සිදුවූ බව මගේ මතකයයි. එහෙත් ඇය තමන්ට අහිමි වන දේ වෙනුවට සියලු අපේක්ෂා රඳවා ගත්තී පොදු අරමුණ කරා ළඟා වීම කෙරෙහිය. පෞද්ගලික පෙම වෙනුවට ඇය එක සිතින් මනුෂ්‍ය වර්ගයා උදෙසා වූ පෙම ඉදිරියට ගත්තාය. සමාජය වෙනස් කළ යුතු බවත් දේශපාලන අරගලය හැර ඒ සඳහා අන් මගක් නැති බවත් ඉඳුරාම විශ්වාස කළ ඇය ඒ මගෙහි තමන්ට ජීවිතය අහිමි වුවද එහිම රැඳී අරගල කරනු හැර අන් විකල්පයක් නැති බව උදක්ම විශ්වාස කළාය.

ඇය පැහැර ගනු ලබන්නේ මේ අතරය. අසූනවයේ එක් දිනෙක පැහැර ගනු ලබනා ඇය යළි හමුවනුයේ මඟ දමා ගොස් සිටියදීය. ශාරීරිකව විවිධ අඩන්තේට්ටම්වලට ලක්ව සිටිය ද යළි අපට හමුවූවේ පෙරටත් වඩා මනසින් සවිමත්, තම අරමුණ කෙරේ පැවති විශ්වාසය වඩාත් වර්ධනය කරගත් අරගලකාරියකි.

එහෙත් දෙවැනි වර ඇය අපට අහිමි වූයේ සදහටමය. තවත් සගයකු මඟින් පැහැරගනු ලැබී යැයි ලැබුණ තොරතුරුවලින් එහාට ඇය ගැන විශ්වසනීය විස්තර කිසිවක් අපට ලැබුණේ නැත. ඒ වනවිට අප කටයුතු කරමින් සිටියේ ද වෙනස් සංවිධානවල හෙයින් මෙන්ම තිරශ්චීන මර්දනය හමුවේ ව්‍යාපාරයේ දැවැන්ත බිඳ වැටීමේ තොරතුරු සොයා ගැනීමට බරපතළ බාධාවක්ව පැවතිණි. අසූනවයේ අග දිනෙක මා පැහැරගනු ලබනා දිනය වනතුරුම මට ඇය ගැන නිශ්චිත තොරතුරක් තිබුණේ නැත.

ඇය පිළිබඳ මගේ මතක යළි පාරන ලද්දේ ඉන් වසර ගණනාවකට පසු දිනෙක මා හමුවට පැමිණි ජවිපෙ ශිෂ්‍ය අංශයේ සහෝදරයකු විසිනි. ඔහු, ම වෙත පැමිණ සිටියේ අතුරුදන් කරන ලද සගයන්ගේ ඡායාරූප ගොන්නක් ද සමඟිනි. ඔහුට ඇවැසිව තිබුණේ ඒ ඡායාරූප අතර තවමත් හඳුනාගත නොහැකිව තිබූ ඒවා මට හඳුනාගත හැකිදැයි බැලීමටය. ඒ සියල්ල පෙරළාගෙන ගිය මට ගමන් සගයන්ගේ විවිධ මතකයන් මා ඉදිරිපිට යළි පණ ලබනයුරු දැනිණ. එක්වරම මගේ නෙත එක් ඡායාරූපයක් මත රැඳුණි. එහි සිටියේ ඇයයි. මම ගල්ගැසී ගියෙමි. දරාගත නොහෙනා වේදනාවකින් හදවත තෙරපෙද්දී මම ඡායාරූප ගොන්න ආපසු දී මේසය මත හිසගසා ගතිමි.

**ඉතිරිය ලබන සතියට...**

**අසූනවයේ එක් දිනෙක පැහැර ගනු ලබනා ඇය යළි හමුවනුයේ මඟ දමා ගොස් සිටියදීය. ඇය ශාරීරිකව විවිධ අඩන්තේට්ටම්වලට ලක්ව සිටියාය. නමුත් ඇය පෙරටත් වඩා මනසින් සවිමත් වී තම අරමුණ කෙරේ පැවති විශ්වාසය වඩාත් වර්ධනය කරගත් අරගලකාරියක් වූවාය.**

▶ චූලානන්ද සමරනායක



# මේ ජයග්‍රහණය ජාතික ජන බලවේගයටත් වඩා විශාලයි

## මහාචාර්ය **නිර්මාල් රංජිත් දේවසිරි**

**ශාස්ත්‍රීය පර්යේෂකයෙකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු මෙන්ම සමාජ ක්‍රියාකාරිකයෙකු වන කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ හිටපු අංශාධිපති, මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි සමඟ කළ කතා බහක් ඇසුරින් මෙම ලිපිය සැකසිණි.**

2024 පැවති ජනාධිපතිවරණයෙන්ද, මහමැතිවරණයෙන්ද ජාතික ජන බලවේගය විසින් මේ වන විට රාජ්‍ය බලය අත්පත් කරගෙන තිබේ. එහෙත් රාජ්‍ය බලය අත්පත්කරගත් ව්‍යාපාරයේ ප්‍රධාන බල කේන්ද්‍රය ජනතා විමුක්ති පෙරමුණයි. එකී බලවේගය විසින් බලය අත්තනෝමතික ලෙස හසුරුවනවාද නැද්ද යන මතය පසෙකින් තැබිය යුතුය. මෙමඟින් මූලික වශයෙන්ම ශ්‍රී ලංකාවේ පැවති සම්ප්‍රදායික දේශපාලන පක්ෂ හා ප්‍රභූ තන්ත්‍රය අර්බුදයකට යාම දැකිය හැකිය. රටේ ප්‍රමුඛතම ආයතන වන ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණ ආදී ප්‍රධාන ආයතන තිබුණා වුවද, සැබෑ දේශපාලනයේ බලය කවදත් පැවතියේ කුඩා කණ්ඩායම් මතය. මාක්ස්වාදී අර්ථයෙන් 'පන්ති' ලෙස බෙදුවා වුවද, පන්තිමය නැඹුරුවක් තිබුණ ද, බලය පවතින්නේ සමස්ත පංතියක් අත නොව පන්තිමය නැඹුරුවක් සහිත කුඩා කණ්ඩායම් අතමය. මහින්ද රාජපක්ෂලා බලයේ සිටින විට රාජපක්ෂ පවුලේ කිහිපදෙනෙකු විසින් බලය හැසිරුවා සේම එජාපය බලයේ සිටියදීද රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ ඔහුගේ අතිශය සමීපතමයින් කිහිප දෙනෙකු පමණක් සැබෑ බලය හැසිර වූ අයුරු සිහිපත් කළ හැකිය. ජේ.ආර්. ජයවර්ධන යුගයේ වුවද "කුස්සි කැබිනෙට්ටුව" ලෙස ප්‍රසිද්ධියේ හැඳින්වූ අති සමීප කුඩා කණ්ඩායමක් තිබිණි. චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිවරියගේ කාලයේ වුවද, මෙම තත්ත්වයෙහි වෙනසක් නැත. හැමදාමත් බලය සංකේන්ද්‍රණය වී පැවති මෙම අභ්‍යන්තර කවය (Inner circle) තුළමය. ඒ අයුරින්ම වත්මන්හි බලය ඇත්තේ ජවිපෙ මධ්‍යම කාරක සභාවට බැව් කිව හැකිය. එහෙත් එය මෙතෙක් පැවති කුඩා කණ්ඩායම්වලට වඩා විශාලය. අනෙක් අතට ජනතාව ඡන්දය ලබා දුන්නේ ඊටත් වඩා විශාල ව්‍යාපාරයකටය. මාලිමාව යනුවෙන් හඳුන්වන්නේ එයයි. පොදුවේ ගත් කල අර යට කී සියලුම කල්ලි, කණ්ඩායම්වලට වඩා අති විශාල ව්‍යාපාරයකි. සැබෑ අර්ථයෙන් කිවහොත් එය ජාතික ජන බලවේගයටත් වඩා විශාල යැයි කිව හැකිය. මන්ද යත් ජනතා අභිලාෂයන්, ඒවා නියෝජනය කළ ඡන්දය යනු ජාතික ජන බලවේගයේ සීමාවන්ටත්, එහා ගිය තත්ත්වයක් පෙන්වන බැවිනි.

'ජාතික ජන බලවේගය' ලෙස බහුජන ව්‍යාපාරයක් ලෙස වර්ධනයවීම ජවිපෙ තුළ ඇතිවූ විශාල පරිවර්තනයක ප්‍රතිඵලයකි. කාඩර් බේස් සංවිධානයක සිට පුළුල් මහජන ව්‍යාපාරයක් දක්වා වර්ධනය වීම යනු විශාල වෙනසකි. එය සාක්ෂාත් කර ගැනීමට හැකිවූයේ ඉතාම මෑත යුගයේ වුවද, ඒ සඳහා ඔවුන් ගත් උත්සාහයන් අතීතයේද දක්නට ලැබුණු බව සිහිපත් කළ යුතුය. 90 දශකයේ අග, 2000 මුලදී මෙවැනි මහජන ව්‍යාපාරයක් ගොඩනැඟීමට ඔවුන් විසින් උත්සාහ දරනු පෙනුණි. දේශ හිතෛෂි ජාතික ව්‍යාපාරය, මානෙල්මල් ව්‍යාපාරය වැනි උත්සාහයන් ඊට නිදසුන්ය. එමඟින් විමල් වීරවංශ වැනි පුද්ගලයින් එහිම ප්‍රතිඵලයක් ලෙස වඩා ජාතිකවාදී වෙමින් වෙනත් ප්‍රවණතාවක් ලෙස කැඩී වෙන්වීම හැරුණු විට සංවිධානයක් ලෙස ජවිපෙට ලැබුණේ අඩු වාසියකි. 2008 පමණ වන විට සංවිධානාත්මක ලෙස එය දුර්වල විය. එහෙත් රාජපක්ෂ තන්ත්‍රය බිඳ වැටෙන විට ඒ තුළින් ඇතිවුණු දේශපාලන හිඩැස පුරවනු පිණිස ජවිපෙ, 'ජාතික ජන බලවේගය' ලෙස පරිවර්තනය වීම සිදුවිය. මාක්ස්වාදී ව්‍යාපාරයන්හි ඉතිහාසය බැලුවද, මෙය ඉතා සුවිශේෂී වූ සංසිද්ධියක් බව කිව හැකිය. ලංකාවේ බොහෝ වාමාංශික ව්‍යාපාරවලට තමන්ගේ රැඩිකල් පදනම අහිමිවීමෙන් පසු පවතින්නට නොහැකි විය. සමසමාජ-කොමියුනිස්ට් පක්ෂවලට අත්වූ ඉරණම එයයි.

### පක්ෂ ක්‍රමය දුර්වලවීම

සමසමාජ- කොමියුනිස්ට් ආදී කාලයක් මෙරට මුල්බැස ගෙන තිබූ වාමාංශික ව්‍යාපාරයන්ට අයත් දේශපාලන සටන්පාඨ පසුකාලීනව වර්ධනය වූ සෙසු පක්ෂ විසින් ඩැහැගන්නා ලදී. සමසමාජ පක්ෂය බිහිවූයේ ලංකාවේ දේශපාලන පක්ෂ බිහිවීමට ප්‍රථමය. ඒ නිසාම සමසමාජ ව්‍යාපාරයේ සටන් පාඨ පසුකාලීනව බිහිවූ දේශපාලන පක්ෂ, බහුජන ව්‍යාපාර ලෙස වර්ධනය වෙද්දී ඔවුන් විසින් ඩැහැගැනීම දැකිය හැකිය. 1956 වන විට එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක විසින්ද, 1947 දී බිහිවූ එජාපයේ පසුකාලීනව (1977 දී) ජේ. ආර් ජයවර්ධන විසින්ද, එය සිදු කරන ලදී. මෙලෙස එජාපය හා ශ්‍රීලනිපය පක්ෂ ද්විපක්ෂ ක්‍රමයක් ලෙස ලාංකේය සමාජය තුළ වර්ධනය වෙද්දී සමසමාජ-කොමියුනිස්ට් ආදීන්ගේ පැවැත්ම අර්බුදයට ලක්විය. එහෙත් ජවිපෙ මෙතනදී වෙනස්ය. 1980 ගණන් වන විට ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය බිඳ වැටෙයි. 90 දශකයේ අග භාගය වන විට මෙම තත්ත්වය තීව්‍ර වේ. ඕනෑම ආයතනයක් වෙනස් නොවී කාලයක් පවතිද්දී මහජන කලකිරීම් ඇතිවීම ස්වභාවිකය. ලංකාවේ පක්ෂ ක්‍රමය තුළ මෙම මහජන කලකිරීම් වර්ධනය වන විට අනෙක් පසින් දේශපාලන නායකත්වය පවා අන්ත දූෂිත තැනට තල්ලු විය. මේ නිසාම අවසාන වශයෙන් සිදුවූයේ අන්ත දෙකෙන්ම පක්ෂ ක්‍රමය දුර්වල වීමය. ඒ අනුව පක්ෂ ක්‍රමයේ අවසානය සනිටුහන් වන කාලය වන විට ජවිපෙ රැඩිකල් පදනමද නිමා විය. 1971 දී සහ 88-89 සන්නද්ධ නැඟිටීම් දෙකකට පසු සම්ප්‍රදායික පක්ෂ ක්‍රමය බිඳවැටීමට සමගාමීව ජවිපෙ රැඩිකල් පදනම දියාරු විය. එය එසේ වී යැයි ජවිපෙ විසින් පිළිනොගන්නා නමුත් සිද්ධ වූයේ එයමය.

මේ අයුරින් රැඩිකල් සන්නද්ධ දේශපාලනය නිමා කරමින් ඔවුන් පොදුජන අවකාශයේ දේශපාලනය තෝරා ගැනීම හා එය පුළුල් කිරීම සිදුවිය. දේශපාලන පක්ෂ ක්‍රමය තුළ පවත්නා කලකිරීම තුළම මෙම පරිවර්තනය සිදුවූ බව කිව හැකිය. 90 දශකයෙන් පසු ජවිපෙ සමඟ පොදුජන අලුත් සම්බන්ධය හැදෙන්නේම පවත්නා සම්ප්‍රදායික පක්ෂ ක්‍රමය කෙරෙහි පවත්නා කලකිරීමට එරෙහිවය. ඒ නිසාම පක්ෂ ක්‍රමයට එරෙහි විකල්පය ලෙස පොදු ජනයා හඳුනාගත්තේ සන්නද්ධ රැඩිකල් පදනම දියාරුවෙමින් බහුජන දේශපාලනයට පිවිසි ජවිපෙය. ජනතා විමුක්ති පෙරමුණට පැවති දේශපාලන වාසිය එයයි. එම වාසිය සමසමාජ පක්ෂයට හෝ කොමියුනිස්ට් පක්ෂයට නොතිබිණි. සමසමාජ-කොමියුනිස්ට් පක්ෂ දෙක ශ්‍රී ලංකා හා යූඇන්පී ඉදිරියේ දියවිය. එහෙත් ශ්‍රී ලංකා - යූඇන්පි දියවන කාලයේ ජවිපෙ වර්ධනය වීම නිසාම පොදුජන අවකාශය තුළ ඉඩ ඔවුන්ට අත්පත් කර ගැනීමට හැකිවිය.

උතුරේ ජනයා දකුණේ දේශපාලන ව්‍යාපාරයකට පවත්නා තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කිරීමද, සුවිශේෂී ලක්ෂණයක් ලෙස හඳුනාගත යුතුය. සාමාන්‍යයෙන් උතුරේ ජනයා වුවද, කල්පනා කරන තත්ත්වය වෙනස්ය. ඒ පිළිබඳ මාගේ පුද්ගලික අත්දැකීමක් සිහිපත් කොට පෙන්වාදිය හැකිය. 1987 අගෝස්තු මාසයේදී, අප විසින් එල්.ටී.ටී.ඊ සංවිධානයේ නියෝජිතයින් පිරිසක් හමුවී සාකච්ඡාවක් සිදුකරන ලදී. එම එල්.ටී.ටී.ඊ. නියෝජිත පිරිස ඉහළ නායකත්වය නොවූවද, මධ්‍යම මට්ටමේ තීන්දු තීරණ ගන්නා පිරිසක නියෝජනයකි. උතුරු-නැගෙනහිර ක්‍රියාත්මක වූ එල්.ටී.ටී.ඊ සංවිධානය, 'ත්‍රස්තවාදී බෙදුම්වාදී ව්‍යාපාරයක්' බවත්, ඔවුන් සමඟ කිසිදු සාකච්ඡාමය ගනුදෙනුවක් නොකළ යුතු බවත් ඒ වන විට ජවිපෙ ස්ථාවරය විය. එහෙත් අප සිටියේ 'ස්වයං නිර්ණය සඳහා ජාතීන් සතු අයිතිය' පිළිගනිමින් දේශපාලනික වශයෙන් එල්.ටී.ටී.ඊයේ දේශපාලන ස්ථාවරයට පක්ෂවය. මේ නිසාම මෙම සාකච්ඡාවේදී අප විසින් ඔවුන් හමුවේ ජවිපෙ දැඩිව විවේචනය කරන ලදී. එය ඉන්දු-ලංකා ගිවිසුමට පසුබිම සැකසෙමින් තිබූ පසුබිමකි. දැඩි ඉන්දීය විරෝධයක්ද ජවිපෙ තුළ විය. ඒ නිසාම මෙම සාකච්ඡාවේදී දැඩිව ජවිපෙ විවේචනය කරද්දී ඔවුන් කතා කළේ ඊට පරස්පරව ජවිපෙ පිළිබඳ ප්‍රසාදයෙනි. ජවිපෙ රැඩිකල් දේශපාලන ව්‍යාපාරයක් ලෙස පිළිගැනීමට ඔවුන් පසුබට නොවීය. අප ජවිපෙට එරෙහිව උතුරේ ජනයාගේ ස්වයං නිර්ණය සඳහා වූ අයිතිය පිළිගන්නා බව පැවසුවද, ඔවුන් එය එතරම් ගණනකට නොගෙන, ස්වයං නිර්ණය උතුරට දීමට දැඩි සේ එරෙහි ජවිපෙ වෙනුවෙන් කතා කරන්නට විය. අපගේ පෙනී සිටීමට වඩා ජවිපෙ ඒ වෙනුවෙන් කළ අරගලයට ඔවුන් වඩා කැමැත්තෙන් සිටි බව පෙනෙන්නට විය. ඒ වෙද්දිත් ඔවුන් වෙනුවෙන් පෙනී සිටි දකුණේ වාමාංශික නායකයින් වූ වික්‍රමබාහු කරුණාරත්න, හිරු කණ්ඩායම වැනි අය වෙනුවට ඔවුන්ට පෙනුණේ රැඩිකල් ව්‍යාපාරයක් ලෙස ජවිපෙ පමණකි.

### ප්‍රගතිශීලි මානයන්

දකුණේ සෙසු දේශපාලන ව්‍යාපාරයන් හෝ මතවාදයන් එක්ක සැසඳීමේදී ජවිපෙ එකී සෙසු අන්තවාදී ප්‍රවණතාවන්ට වඩා යම් ප්‍රගතිශීලි ගුණයකින්ද යුතු බව එකලම ඔවුන් විසින් වටහා ගෙන තිබුණු බව එයින් පැහැදිලිය. ඔවුන්ට ජවිපෙ සැබවින්ම විශේෂිතය. පාඨලී චම්පික රණවක, ගම්මන්පිල පන්නයේ දැඩි ජාතිවාදී ස්ථාවරයක් වෙනුවට ජවිපෙහි යම් ජාතිකවාදී ස්වරූපයක් තුළ වුවද, ප්‍රගතිශීලි මානයන් ඔවුන් විසින් හඳුනාගෙන තිබුණි. වෙනත් අයුරකින් කිවහොත් ජවිපෙ තුළ ස්වයං නිර්ණය වැනි වඩා ප්‍රගතිශීලි ස්ථාවරයන් නොවුණද, චම්පිකලාට, ගම්මන්පිලලා තරමට අන්තවාදී නොවීම, ඔවුන්ට යම් සුබවාදී බලාපොරොත්තුවක් ගෙන ඒමට සමත් වන්නට ඇතැයි කිව හැකිය. ඒ නිසාම මෙවර උතුරේ ඡන්දය ජාතික ජන බලවේගයට ලැබීමද, ඒ අර්ථයෙන් පුදුම විය යුතු කාරණයක් නොවන බව පෙනේ. මෙහිදී

**ජවිපෙ තුළ ස්වයං නිර්ණය වැනි වඩා ප්‍රගතිශීලි ස්ථාවරයන් නොවුණද, චම්පිකලාට, ගම්මන්පිලලා තරමට අන්තවාදී නොවීම, ඔවුන්ට යම් සුබවාදී බලාපොරොත්තුවක් ගෙන ඒමට සමත් වන්නට ඇතැයි කිව හැකිය. ඒ නිසාම මෙවර උතුරේ ඡන්දය ජාතික ජන බලවේගයට ලැබීමද, ඒ අර්ථයෙන් පුදුම විය යුතු කාරණයක් නොවන බව පෙනේ. මෙහිදී ඉන්දියානු බලපෑම තිබුණාද නැද්ද එතරම් වැදගත් නොවේ.**



ඉන්දියානු බලපෑම තිබුණාද නැද්ද එතරම් වැදගත් නොවේ. උතුරේ ජනයා නියෝජනය කරන දමිළ ජාතික නායකයින් මෙවර ජනාධිපතිවරණයේදී හෝ මහමැතිවරණයේදී 13 වන ව්‍යවස්ථා සංශෝධනය හෝ එතැනින් එහාට ගිය බලතල පිළිබඳ සංවාදය පවා කරළියට පැමිණියේ නැත. එහි අරුත නම් ඊට වඩා දෛනික ජීවිතයේ යම් යම් අවශ්‍යතාවන් රාශියක් ඔවුන් විසින් ප්‍රමුඛ කොට සැලකීමය. ජාතික ජන බලවේගය තරමේ පශ්චාත් යුද සම්මුතිවාදී දේශපාලනයක් උතුරට හමුවී නොතිබීම, අධි ආරක්ෂිත කලාප ඉවත් කර ගැනීම, මාර්ග බාධක ඉවත් කර ගැනීම, තමන්ගෙ ඉඩම් නැවත අත්පත් කර ගැනීම වැනි දෛනික ජීවිතයේ වඩාත් සංවේදී ගැටලු කෙරෙහි ඔවුන්ගේ වැඩි අවධානය යොමුවූ බවක් සිතිය හැකිය. පළාත් සභා හෝ දේශපාලන අයිතිවාසිකම් වශයෙන් ඔවුන්ගේ අභිලාෂයන් යටපත්වී ඇතැයි මෙයින් අදහස් නොකෙරෙන අතර එම සංවාදය තිබියදීම වෙනත් ප්‍රමුඛතාවන් ඉදිරියට පැමිණි ඇති බව පමණක් සැලකීම වටී.

එසේම දකුණේ රණකාමී ජාතිකවාදයට උතුර තවමත් බියක් දක්වයි. මහින්ද - ගෝඨාභය ප්‍රමුඛ රාජපක්ෂලා වුවද, වපුරනු ලැබුවේත්, ක්‍රියාත්මක කරනු ලැබුවේත් සිංහල රණකාමී ජාතිකවාදයකි. ඔවුන් ප්‍රමුඛ ජාතිවාදී පිරිස් තම දේශපාලන දහම (doctrine) බවට පත්කරගෙන තිබුණේ මෙම රණකාමී ජාතිකවාදයයි. එබැවින් එකී බිය තිබියදීම මෙවර ජාතික ජන බලවේගය නියෝජනය කළ බිමල් රත්නායක, අනුර කුමාර වැනි නායකයින් ආමන්ත්‍රණය කළේද, උතුරේ මධ්‍යම පාන්තිකයින්ට බැව් මාගේ පුද්ගලික හැඟීමය. ඒ තුළින් රණකාමී ජාතිකවාදී ප්‍රවණතාවට දැක්වූ බිය මෙන්ම නව නිදහස්වාදී වාතාවරණයක් පිළිබඳ බලාපොරොත්තුවද කැටිවී තිබුණු බව අවධාරණය කළ හැකිය.

### ගෝලීය උපායමාර්ග

භූ දේශපාලනය තුළ වත්මන් ආණ්ඩුවට කෙබඳු තත්ත්වයකට මුහුණ දෙන්නට සිදුවේදැයි ඇතැමුන් අසනු පෙනෙයි. ගෝලීය උපාය මාර්ගික සැලසුම් යනු සෑම කාලයකම එක ලෙස, එකම තත්ත්වයකින් බලපවත්නා කාරණයක් නොවේ. බලවතුන්ට ලෝකයේ බල තුලනය පිළිබඳ යම් යම් උපාය මාර්ගික වැඩපිළිවෙළක් තිබෙන බව සත්‍යයකි. නිදසුනක් ලෙස මේ යුගයේ ඊශ්‍රායලය-පලස්තීනය, රුසියානු-යුක්‍රේන ගැටලුව ආදී සාධක තරමට ලංකාව ඔවුන්ට අදාළ වේ යැයි සිතිය නොහැකිය. ලංකාවේ භූගෝලීය පිහිටීම හා උපාය මාර්ගික වශයෙන් අමෙරිකා එක්සත් ජනපදයටත්, චීනයටත්, ඉන්දියාවටත් පවත්නා වැදගත්කම අහෝසිවී ඇතැයි මෙයින් අදහස් නොකෙරේ. නමුත් ශ්‍රී ලංකාවට වඩා ඔවුන්ගේ අවධානයට ලක්විය යුතු කරුණු කාරණා බොහොමයක් ලෝකයේ පවතින බව අප අමතක නොකළ යුතුය. එබැවින් පෙර පැවති තත්ත්වයන් තවදුරටත් ඒ ආකාරයෙන්ම පැවතෙනු ඇතැයි උපකල්පනය කළ නොහැකිය. වෙනත් අයුරකින් කිවහොත් භූ දේශපාලනයේ හොට්ස්පොට් එකක් බවට ලංකාව තවමත් පත්වී නැත.

### ප්‍රඥාවන්ත විදේශ ප්‍රතිපත්තියක්

පැවති යුද්ධය නිමාවී රට යම් වෙනස් තත්ත්වයකට පත්වීමෙන් පසු ඒ සියලුදෙනාගේ අවධානය යොමුව ඇත්තේ රටේ විදේශ ප්‍රතිපත්තිය ඔවුන්ට කළමනාකරණය කරගත හැකි මට්ටමේ තිබේද යන්න පමණකි. ශ්‍රී ලංකාවේ මැතිවරණවලින් බලයට පත්වන්නේ වාමාංශික ආණ්ඩුවක්ද, දක්ෂිණාංශික ආණ්ඩුවක්ද යන්න ඔවුනට ඒ තරම් වැදගත් නොවේ. ඒ කුමන ආණ්ඩුවක් සමඟ වුවද, ඔවුන්ට ගැටුමකින් තොරව ගනුදෙනු කළ හැකිය. ඒ කිසිවක් ඔවුන්ට අභියෝගයක් විය නොහැකිය. අප රටට මැදිහත් මාවතක ප්‍රඥාවන්ත විදේශ ප්‍රතිපත්තියක් අවශ්‍යය. මන්ද යත්, භූ දේශපාලන බලපෑම් නැත්තටම නැතිවී ඇතැයි කිව නොහැකි නිසාවෙනි. නමුත් ලෝකයේ වෙනත් ගැටලු සමඟ සසඳා බලන විට ලංකාවේ තත්ත්වයන් ඔවුන් කිසිවෙකුටත් එතරම් තීරණාත්මක නොවනු ඇති බව පමණක් සිහියේ තබා ගනු වටියි. අතීතයේදී මෙන් ජාත්‍යන්තර සංසිද්ධිවලදී පැත්තක් ගැනීමට හැකියාවක් කොහෙත්ම නැත. අමෙරිකාව යනු අපගේ අපනයන මිලදී ගන්නා ප්‍රමුඛයෙකු වීමත්, චීනය යනු ජාත්‍යන්තර වෙළෙඳාමේ මෙන්ම ණය ලබාදීම-විවිධ සංවර්ධන ව්‍යාපෘතිවල තීරකයා වීමත්, ඉන්දියාව යනු අසල්වැසි බලවතා වීමත් යන සාධක සියල්ල තවදුරටත් වලංගුය. මේ සියල්ල හොඳින් කළමනාකරණය කර ගැනීම අත්‍යවශ්‍යය. එහෙත් ලංකාවේ අභ්‍යන්තර ජාතික දේශපාලනය තුළ වීරවංශලා, ගම්මන්පිලලා ආදීන් කියන තරමේ අවදානමක් දකින්නට නොලැබෙන බව නම් විශ්වාසය. "මෙරට ජන අරගලය මෙහෙයවනු ලැබුවේ අමෙරිකාව විසිනි" වැනි ප්‍රලාප අමු විහිළුමය.

**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර**

# නැවත වතත් කියවිය යුතු ඉතිහාසය

**පසුගිය දශක කිහිපය පුරාම බලය ලබාගන්නට අර අදිනා දේශපාලකයන් තම බලය ලබා ගැනීම වෙනුවෙන් වේදිකාවල භාවිත කළ ලාභාදායීම මෙවලම වූයේ උතුරු නැගෙනහිර යුද්ධයයි. ඉන් පරිබාහිරව තම කඳවුර වෙනුවෙන් වාසි සහගත යමක් ප්‍රකාශ වූයේ නම් ඒ ඔවුන් විසින්ම නිර්මාණය කළ ජනතා විමුක්ති පෙරමුණ මත පටවන ලද 88-89 භීෂණයයි.**

වර්තමානයේ බහුතරයක් දෙනා වරදවා ගත් තැන වන්නේ මූලික අවස්ථා සම්බන්ධය නොදැන කතන්දරය මැදින් අල්ලාගැනීමය. අර්ථකථන සපයන්නේ ද එතැන් සිටය, එහෙයින් ඔවුන් විසින් 88-89 කාල වකවානුව හඳුන්වා දෙනු ලබන්නේ බලය අල්ලා ගැනීමේ ආශාවකින් යුතු සන්නද්ධ කණ්ඩායමක් කළ ගරිල්ලා සටනක් ලෙසිනි. ඔවුන් ඒ සියල්ල ලසු කර තැබුවේ කතාව මැදින් අල්ලාගත් පසු තම තමා විසින්ම නිර්මාණය කරගත් කතා ඇසුරිනි. එහෙත් මේ මොහොතේදී ඉතිහාසය අඩු ලුහුඬුකම් සහිතව කතාබහ කරනවාට වඩා අවස්ථා සම්බන්ධයන් නිසි අයුරින් ගළපා ගැනීම වටී.

ජේ. ආර්. ජයවර්ධන 1977 දී පාර්ලිමේන්තුවේ ආසන 168න් 140ක් දිනාගනිමින් අතිවිශාල ජයග්‍රහණයක් ලබාගැනීමට සමත් වූයේ හයෙන් පහක බලය ද තමා වෙත රඳවා ගනිමිනි. ඒ සමගම 1978 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කිරීමට ද ඔහු පසුබට නොවීය. තමා වෙත හයෙන් පහක යෝධ බලයක් ලබාදීමට මුල් වූ ජනතාව ඔහු කිසිවිටෙකත් අමතක නොකළේය. එය කවරාකාර ද යත් තම වැටුප වැඩිකරන්න යැයි සේවකයන් කළ උද්ඝෝෂණය වෙනුවෙන් ඔහු ඉටුකළේ දහස් ගණනක් සේවකයන් රැකියාවලින් දොට්ට දමා දරු පවුල් ද අසරණ භාවයේ ගිල්වීමය. ඉන්පසුව පැමිණි සංවර්ධන සභා ඡන්දය ශ්‍රී ලංකාවේ පැවති දූෂිතම මැතිවරණයන්ගෙන් එකක් විය. පුද්ගල බියවැද්දීමේ සිට හොර ඡන්ද දැමීම දක්වා එය ව්‍යාප්තව තිබිණි. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයේ සිටි ජනතා විමුක්ති පෙරමුණ දිස්ත්‍රික්ක කිහිපයකින් තරග කරමින් ආසන කිහිපයක් දිනාගැනීමට ද සමත් විය. දෙමළ ජනතාවගේ ඉතිහාසය පවා වැළලී ගියේ 1981 වසරේදී යාපනයේ පුස්තකාලය ගිනිබත් කිරීමත් සමඟිනි. 1982 වසර වනවිටත් ජනතා විමුක්ති පෙරමුණ රෝහණ විජේවීරගේ මූලිකත්වයෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙමින් ඡන්ද 273,428ක් ලබාගත්තේ ශ්‍රී ලංකාවේ තෙවෙනි බලවේගය බවට පත්වෙමිනි. වැදගත්ම සිදුවීම වන්නේ ඉන් අනතුරුවය. ජනාධිපතිවරණයෙන් පසුව 1983දී මහ මැතිවරණය පැවැත්වීමට තිබුණද ජේ.ආර්. ජයවර්ධන විසින් මැතිවරණ සිතියම හකුළා දැමීමට කටයුතු කළේය. ඒ ඔහුගේ අභිලාෂයන් වෙනුවෙනි. මැතිවරණයක් නොපවත්වාම 1982 දෙසැම්බරයේදී ලාම්පු කළගෙඩි සෙල්ලම කරළියට ගෙන එමින් පාර්ලිමේන්තුව කල්තැබීමට ඔහු කටයුතු කළේ මැතිවරණය පැවැත්වූයේ නම් ඔහුට නව ඡන්ද ක්‍රමයට අනුව හයෙන් පහක බලය නොලැබී යන හෙයිනි.

ඔහුට හයෙන් පහක බලය අහෝසි වී යනවා පමණක් නොව ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් කිහිපදෙනෙක් පාර්ලිමේන්තුවට පැමිණීමේ අවස්ථාවක් ද පෙනෙන්නට විය. පැහැදිලිවම එය ඡන්ද අයිතිය මංකොල්ලකෑමක් බව පෙනී යන කරුණක් මුත් සියල්ලෝම මුනිවත රකිද්දී එයට විරුද්ධව හඬ නගන්නට ජනතා විමුක්ති




**අයකු යම් වරදක් කරේ නම් නීතිය මගින් දඬුවම් කිරීම පිළිබඳව කිසිවකුත් දොසක් නගන්නේ නැත. එහෙත් රාජ්‍ය තන්ත්‍රය විසින් සිදුකරනු ලැබුවේ කිසිදු වගවිභාගයකින් තොරව ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් ඝාතනය කිරීමයි. මේ අනුව බලන කල නඩුත් හාමුදුරුවන්ගේය. බඩුත් හාමුදුරුවන්ගේය.**

පෙරමුණ ඉදිරිපත් විය. එම විරුද්ධවීමම, එම හඬ නැඟීමම ජේ.ආර්.ගේ මර්දනීය ක්‍රියාපිළිවෙත ඔවුන් දඩයම් කිරීමට යුහුසුළු විය. ජනමත විචාරණ කුමන්ත්‍රණයත් සමඟින් පවතින ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කිරීමේ ගමන් මඟට යොමුව ඇති බව අවබෝධ කරගත් ජනතා විමුක්ති පෙරමුණ ජනමත විචාරණය පැරදවීම වෙනුවෙන් කටයුතු කරන්නට විය. ඒ කෙසේ වෙතත් ලාම්පු කළගෙඩි කතාවේ අවසානය වූයේ ජේ.ආර්. ජයවර්ධන තම අභිමතය සාක්ෂාත් කරගැනීමට සමත් වීමයි. ජනමත විචාරණය තුළ පවා පෙරටත් වඩා දැඩිව ඡන්ද මංකොල්ලකෑම්වලින් පිරි දූෂිතම තත්ත්වයක් පිළිබිඹු විය.

මැතිවරණය නොපැවැත්වීමේ කරුණ මූලික කරගනිමින් රෝහණ විජේවීර නඩුවක් ගොනුකිරීමට කටයුතු කරනු ලැබුවේ මෙවන් වාතාවරණයකදීය. එම ගොනු කරන ලද නඩුව අනුව අධිකරණය විසින් විභාගයට ගෙන නියෝගයක් දුන්නේ නම් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට සිදුවන බව ජේ. ආර්.ජයවර්ධන ප්‍රමුඛ ආණ්ඩුව හොඳින්ම දැන සිටි කරුණකි. මේ අතරවාරයේ 83 ජූලි කලබල ඇතිවීමට මං තැනුණේ උතුරුකරයේ හමුදා නිලධාරීන් 13 දෙනෙකුට බෝම්බ ප්‍රහාරයක් එල්ලවීමත් සමගිනි. මෙය මූලික කරගනිමින් ලංකාව පුරා කලකෝලාහල ඇතිවූ අතර එය කරුණක් කරගනිමින් සියල්ලටම පෙර ධර්මිෂ්ට සමාජයක් බිහිකිරීම වෙනුවෙන් බලයට පැමිණි ජේ.ආර්. 83 ජූලි කලබලවලින් අභවරව ජනතා විමුක්ති පෙරමුණ තහනම් කිරීමට කටයුතු කරනු ලැබුවේ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය හා නව සමසමාජ පක්ෂයත් සමගිනි. කෙටි කලක් තුළ ජනතා විමුක්ති පෙරමුණේ හැර අනිකුත් පක්ෂ දෙකෙහි තහනම ජයවර්ධන ආණ්ඩුව විසින් ඉවත් කරන්නට කටයුතු කරනු ලැබුවේ, ජනතා විමුක්ති පෙරමුණ යනු ඔහුට අභියෝගයක්ම බව දන්නා හෙයිනි. එහෙයින් ඔවුන්ගේ තහනම දිගටම පවත්වන්නට කටයුතු කළේය. වික්‍රමබාහුත්, වාසුදේවත් තම පක්ෂ සමඟින් නැවත දේශපාලනයේ යෙදෙන විට රෝහණ විජේවීරට සිදුවූයේ තම පක්ෂය රැකගැනීමේ අභියෝගයට මුහුණදීමටය.

එහෙයින් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන්ට සිදුවූයේ රහසිගත දේශපාලනයේ නිරත වීමටය. තවත් ලෙසකින් කිවහොත් ආණ්ඩුව සමඟ සටන් වැදීමටය. රාජ්‍ය තුවක්කු තමන් දෙසට එල්ලවන විට ඔවුනට ද පිළිතුරුදීමට සිදුවූයේ ඒ හා සමානවය. ජේ.ආර්.ගේ ආණ්ඩුව විසින් ගෙන ගිය වඩා මර්දනකාරී වූ ක්‍රියාපිළිවෙත තුළ, ප්‍රජාතන්ත්‍රවාදී රාමුවේ සිටි පක්ෂයක් තහනම් කර අවසානයේ සියල්ල ඔවුන් පිට පැටවීමට සාහසික වීම ඒ ආකාරයෙන් ඇරඹිණි. මුරකාවල් දමා නිවෙසක් වටකොට නිවෙස තුළට ගල්මුල් ගසන්නා බලාපොරොත්තු විය යුතුම කරුණක් තිබේ. එනම් නිවෙස තුළ සිටින්නන් ද තමා පහරදුන් ගල්මුල්වලින්ම පෙරළා පහර දෙන බවයි. එය ඔවුන් බලාපොරොත්තු වුවද නොවුවද එය ඒ ආකාරයෙන්ම සිදුවිය.

ජනතා විමුක්ති පෙරමුණ තහනම් කිරීමෙන් පසුව වුවද ජයවර්ධන ආණ්ඩුවේ මර්දනය ඒ අයුරින්ම ක්‍රියාත්මක වූ අතර රෝහණ විජේවීර, උපතිස්ස ගමනායක පිළිබඳව තොරතුරු ලබාදෙන්නන්ට මුදල් ත්‍යාගයන් ලබාදෙන බවට පුවත් නිවේදන පවා නිකුත් විය. කෙසේ වෙතත් දිගින් දිගටම ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ තහනම පැවති අතර 1987 මැයි රැලිය එක්සත් ජාතික පක්ෂ රජය විසින් තහනම් කරන්නට විය. එහෙත් ආණ්ඩු විරෝධී ව්‍යාපාර විසින් නාරාහේන්පිට අභයාරාමයේදී පැවැත්වූ මැයි සැමරුමෙන් පසු පැවති විරෝධතා පෙළපාළියට පොලීසිය සිදුකළ වෙඩි තැබීමෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කිත්සිරිමෙවන් රණවක සහ ඛනිජතෙල් සංස්ථාවේ ආනන්ද ලාල් කිරිබත්ගොඩ ඝාතනයට ලක්විය. 1987 දීම ඉන්දු ලංකා ගිවිසුමට විරෝධතා පළකළ පෙළපාළිකරුවන් ඝාතනය කිරීමට ද ආණ්ඩුවේ තුවක්කු හිතක් පපුවක් නැති ලෙසින් එල්ලවිය.

අයකු යම් වරදක් කරේ නම් නීතිය මගින් දඬුවම් කිරීම පිළිබඳව කිසිවකුත් දොසක් නඟන්නේ නැත. එහෙත් රාජ්‍ය තන්ත්‍රය විසින් සිදුකරනු ලැබුවේ කිසිදු වගවිභාගයකින් තොරව ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් ඝාතනය කිරීමයි. මේ අනුව බලන කල නඩුත් හාමුදුරුවන්ගේය. බඩුත් හාමුදුරුවන්ගේය. එනිසා එවක බලයේ සිටින්නන් වෙනස්ම ආකාරයෙන් ලියා තැබූ ඉතිහාසය අප නිවැරදි ආකාරයෙන් අවබෝධාත්මකව කියවා ගැනීම වටී.

**රජිත බස්නායක**

ප්‍රවේශ

වියත් සංවාදයට පෙරවදනක්

# අඳුරෙත් දිලිහෙන ලෙස රේඩියම් ගෑ කවි



ප්‍රියලාල් කොග්ගලගේ




සතුට මැරුණ හැටි කියන්න කවියෙකුට ඕන වෙන්නෙ ඇයි? කවියා සතුටෙන් පරිබාහිරව හිටගෙන ඉන්න නිසාද? නැත්නම් ඇත්තටම ඒක තමන් විතරක් දන්න 'රහසක්' නිසාද? 55 පිටුවෙ 'සතුට' කවියෙ සතුට ඇරෙන්න අනිත් ඔක්කොම තියෙන එක ගැන මුලින්ම මම පුදුමයට පත් වුණා. මනුස්ස ජීවිතේක සතුට මනින ඒකකය මොකක් වෙන්න පුළුවන්ද කියලා ආයෙමත් කල්පනාවකට වැටෙන්න ඉඩකුත් මේ කවියෙන් හදලා තියෙනවා.

**"මේ සතුටු මිනිසාගේ මළගම**
**සතුටින් සිටින සියල්ලෝම මෙහි පැමිණ ඇත**
**එතකොට නුඹ නොආවේ මන්ද....."**

මේ කවිය උපුටන්නේ ප්‍රියලාල් කොග්ගලගේගෙ 'ශාපලත් සේපියන්' කවි පොතෙන්. කොග්ගලගේ කොහොමත් කවිය අල්ලන්නෙම වෙනම තැනකින්. ඒක එක්තරා වැහුණු මනෝ ලෝකයක ඉදලා හිටලා ඇරලා දෙන කවුළුවක් වගෙයි. ඔහු හරිම ප්‍රශ්නකාරීයි. පාරිභෝගික සමාජයේ සිද්ධ වෙන බොහෝ දේවල් ඔහු කවි ඇතුළෙ ප්‍රශ්න කරනවා. හැබැයි හැම කවියකම ඔහුගේ ජීවන දර්ශනය හංගනවා. නමුත් කිසිම මොහොතක ඔහුගෙ කල්පනා ලෝකයට කාවවත් ගන්නෑ. හැමෝටම එළියෙ පුටු දාලා තියෙනවා වාඩිවෙලා ඉන්න. ඒක තමයි සීමාව. කොග්ගලගේගෙ කාව්‍යමය වීර චාරිකාව බරත්, සැහැල්ලුවත් එකම කාසියේ දෙපැත්තෙ තියෙන එකක් කියලයි මට හිතෙන්නෙ.

**"...කුණාටුවක සෝෂාව**
**අතීතයෙන් ඇහෙනකොට**
**කෙනෙකුගේ ජීවිතයම ඉවරයි.."**
**"...අවමංගල්‍ය සභාවෙන් අවසරයි**
**මං ඔබට රහසක් කියන්නම්**
**ඇත්තටම මැරුණෙ සතුට විතරයි**
**සතුටු නැති මිනිහෙක් තවමත්**
**ඔබ අතර සැරිසරයි"**

එහෙමයි කවි පොත ඉවර වෙන්නෙ.

දැන් මේ සතුට නැතිව අපේ අතර සැරිසරන මිනිහව හොයන්න මහන්සි වෙලා පලක් නැති බව මුලින් හිතට ගන්න එක නුවණක්කාරයි. එහෙම සතුට අහිමි වුණ මිනිස්සු දස දහස් ගාණෙන් ඉන්නවා. ඒත් සතුට මැරුණට මිනිස්සු ඉන්නවා. හරියට නිකං රූපාන්තරණය වුණ සොම්බි වගේ. කවියා කියන 'රහස' දැනටමත් දන්න අපි ඇයි කලබල නොවෙන්නෙ කියලා හිතෙන්න පුළුවන්. ඒ කියන්නෙ මේ අපෙත් සතුට අහිමි වෙලාද? ඒ කලබලයට පත්වීමවත් අපිට දැන් දැනෙන්නෙ නැතිද? කලින් කිව්ව බරත්, සැහැල්ලුවත් එකම කාසියේ දෙපැත්ත වගේ දැනෙන්නෙ කවියාගෙ වචනවලින් දමා ගැහීමේ හැකියාව නිසයි. ඒවා යට ශෝකය, කෝපය, කලකිරීම, වේදනාව සහ දර්ශනයක් තියෙනවා. වචනවලට ඔහු නිතරම තේරුමක් දෙනවා. හිස් වචන පාවිච්චි නොකරන්න ප්‍රවේසම් වෙනවා.

මේක වර්තමාන කවියො වැඩිපුර නොකරන දෙයක්. වචනවලට තේරුමක් දෙන්න උත්සාහ නොකර ඒ වචනවල ශබ්දයට හරි අලංකාරයට හරි වසඟ වෙන කවියෝ හිස් වචන ශබ්ද කරනවා. ඒකෙන් කවියට එකතු වෙන්නෙ බොල් හඬක්. කවියට යම් ආත්මයක් තියෙනවා නම් ඒ ආත්මය ඉතාම නිර්ලජ්ජිත විදිහට විනාශ කරලා දානවා. නමුත් කොග්ගලගේ, වචන එක්ක තමන්ට කරන්න පුළුවන් ගනුදෙනුවෙ බරපතළකම ගැන අවදියෙන්, අවබෝධයෙන් ඉන්නෙ. ඒකයි ඔහු කියන දේවල් අපිට කරන තර්ජන හෝ අපෙන් කරන ප්‍රශ්න කිරීම් වගේ සමහර වෙලාවට දැනෙන්නෙ. ඒ යථා සිහියෙන් පසුවීමේ ගුණයට මම ඉතාම කැමතියි.

මේ 54 වැනි පිටුවෙ කවියක අග කොටස, මාතෘකාව 'සිතුවිල්ලක්'.

**"....නොමැරී සිටීමේ තරගයෙන්, අදත් අප දිනූ බව ඇත්ත**
**එනමුත් කොහොම වේවිද, හෙට නැත්නම් අනිද්දා!...."**
**ඊට පස්සෙ ඔහුගෙ යෝජනාව වෙන්නෙත් සිතුවිල්ලක්.**

දූපතේ අපිව ඔහු ශිෂ්ටාචාරගත කරන්න හිතන්නෙ එහෙම. මේ කවියෙ පටන් ගැන්මේ තමයි අවශ්‍ය වෙඩි උණ්ඩ, මෝටාර්, බට්ටො ආදිය තියෙන්නෙ. ඩයිනමයිට් වළලලා ඒ දිගේ එළපු වෙඩි බෙහෙත් නූල තියෙන්නෙ කවියාගෙ අතේ. ගිනිකූර ගහන්න අයිතිය තියෙන්නෙ ඔහුට. ඉතිං ඔහුට පුළුවන් ඕනෑම වෙලාවක ඒකට ගිනි තියන්න.

**"උදෑසන පිටත් වූ තැන් පටන්**
**පාපුවරුවෙන් නොවැටී**
**පදික මාරුවක හැපී නොමැරී**
**දාමරික පිහි පහරක – උණ්ඩයක නොගැටී**
**රජයේ හෝ රජයට සම්බන්ධ අයගේ**
**උදහසට ලක් නොවී**
**නිරුපද්‍රිතව නිවස වෙත පැමිණීමේ**
**කුඩා ජයග්‍රහණයේ ප්‍රීතිය**
**මං අදත් භුක්ති වින්දා..."**

දැන් තේරෙනවා නේද වෙඩි බෙහෙත් නූල එක අතකින් අල්ලගෙනයි ඔහු නින්දට යන්නෙ කියලත්? මේ ජීවන සටන කියන්න ලාලිත්‍යයක් පාවිච්චි කරන්න බැරි බව ආයෙත් කියන්න වුවමණා නෑ.

48 පිටුවෙ අමුතු පෙම් කවියක් තියෙනවා. මාතෘකාව 'දිස්නයක්'

**"රැයේ අඳුරෙහි, ඇස් දෙබෑ කර, දිස්නෙ දෙන්නට, මේ තරම්**
**සිතේ සිරවුණු, ඇගේ මතකෙට, කවුද ගෑවේ රේඩියම්"**

ඔහුගෙ පෙම් කවිත් ප්‍රශ්නකාරීයි. ඒ වගේම පුදුම දීප්තියක් සහිතයි. ඇත්තටම ඔහුගෙ ගොඩක් කවිවල ඔහු විසින්ම රේඩියම් ගාලා තමයි තියෙන්නෙ. අඳුරෙත් දිලිහෙන මේ කවි බොහොම ආකර්ෂණීයයි. කවියාගේ වදන් කෝෂයේ මෙන්න මේ වගේ අමුතු උපමා රූපක වැඩ තියෙනවා. මතකයකට රේඩියම් ගානවා වගේ යෙදුමක තියෙන දීප්තිය වෙනත් කිසිම සිංහල වචන කීපයක් එකට පුරුද්දලා ගන්න බැරි තරම්. ඒවා එන්නෙ අතිශය වේදනාකාරී මතකයක් දෙබෑ කරගෙන වෙන්න පුළුවන් කියලා මං අනුමාන කරනවා.

ඊළඟට මේ කවි පොතෙන් මට හම්බවුණ ආනන්දනීයම දේ තමයි 'හඳ' ගැන ඔහුට තියෙන ආරෝව. හැම තැනම හඳ ඉන්නවා.

**"වෙසක් සඳ ඇගෙන් මුදු බව උරාගෙන**
**සුදු රෙදි එළූ අහසේ ඇන තියාගෙන**
**තව පව් නොදී ඇරපන් ඩෝ තැබෑරුම"**

දැන් මේකෙ ලස්සනම වැඩේ වෙසක් සඳ පවා මුදු බව උරාගෙන තියෙන්නෙ 'ඇගෙන්' කියනෙක. පෙම් කවියකුත් වෙන, එහෙමත් නොවන මේ කවියේ ශරීරය වෙනස් වෙන්නෙ අන්තිම පදයට එනකොට.

නැවත ඔහුගෙ හඳ එක්ක තියෙන ආරෝව හම්බවෙන්නෙ 26 පිටුවෙන්. කවියෙ මාතෘකාව 'සටනක්'.

**"ඔරායන් ඔය හටන නවතා මේක පොඩ්ඩක් අහගනින්**
**බලාපන් ඔය දුන්නෙ මලකඩ ඉදා! මේකෙන් පිහගනින්**
**උඹට වැඩියෙන් දරුණු තරහක් සඳට මා තුළ ඇති බැවින්**
**මගේ බර අවි පත්තු කෙරුවා – මචං කන් දෙක වගගනින්"**

ඔරායන්ගෙ දුන්නෙ මලකඩ. හටන නවත්තලා මලකඩ පිහින්න ගිහින් ඔරායන් පිහි ඇනුම් කාවිද? ඔක්කොමත් හරි ඔරායන්ට මචං කියලත් කියනවා. මේවා හරිම නාටකීයයි. ඒ වගේම බහු අරුත් සම්පාදනය කරනවා.

ආයෙත් 11 වැනි පිටුවෙන් හඳ හම්බවෙනවා.

**"....ඔබ ගගනගාමියෙක් වෙන්න ඇති**
**චන්ද්‍ර තරණය කරන්නැති**
**ඒත් මට හඳ තාම කිරි හට්ටියක්"**
**"ජීවිතේ සරල තේරුම**
**මැරෙන එක වෙන්න ඇති...."**

ජීවිතේ සරල තේරුම මැරෙන එක කිව්වම මේ අපේ පෘතග්ජන ජීවිතවලට හීන් බයක්, සීතලක් ගලාගෙන යනවා තේරෙනවා. මේ තිගැස්ම නතර වෙන සුලු එකක් නෙවෙයි. ඒක මතු වෙමින්, නැති වෙමින්, ආයෙත් ඉපදෙමින් තියෙනවා.

'යෝධයෙක්' කවිය ගේන දේශපාලනය අගත, අනගත හැම කාලෙටම ගළපගන්න පුළුවන්කමක් තියෙනවා.

ගලිවර්ලා කොයිකාලෙත් ලිලිපුට් වීදිවල ඇවිදිනවා තමයි. ඒ ඇවිදින්නෙත් ඉතා තදබද වෙලාවල් බලලා. දැන් චලන චිත්‍රයක් වැඩ කරනවා.

කොපමණ මෙවැනි යන්ත්‍ර අපට ඕනෑවෙයිද මේ කිළිටි දූපතේ පිරිසුදු හුස්මක් ගන්න? ඒක තමයි ප්‍රශ්නය. එහෙම යන්ත්‍ර පණ ගැන්විලා යෝධයන් කියල හිතන් හිටපු චෞරයන්ව බිම හෙළුවා මතකයි. ඒත් සමඟම වීරයෝ බිහි කරන යන්ත්‍රයකුත් පණ ගැන්විලා තිබුණා. ඒකෙන් තමයි ගලිවර්වරුන්ව ලිලිපුට්ටන් බවට රූපාන්තරණය කළේ.

ඊළඟ කවියේ මාතෘකාව **'නොගැලීමක්'**.

**"වැඩි සැර මැහි තෙල් ඉහගන්න ඕන හින්දයි**
**අලුත් ගොවිරාළ පත්කරගත්තේ..."**

මේ උත්ප්‍රාසාත්මක 'අලුත් ගොවිරාල' යෙදුම ඇතුළේ උපහාසයකුත් ගැබ් වෙලා තියෙනවා. මෑතකාලීන දේශපාලන මොහොතක් කවිය ඇතුළේ වර නැඟෙන්නේ ඒ දෙකම කලවම් වෙලා. ඔහුගේ කවි බසේ තියෙන පොහොසත්කම අහුවෙන්නෙ මෙන්න මේ වගේ අවස්ථාවලයි. කවිය ඉල්ලා සිටින පෙනී සිටීමේ අවස්ථාවට කිසිම වෙලාවක කවියා රිංගාගන්න යන්නෙ නෑ. ඔහු නිතරම කවියෙන් එළියේ ඉන්නත්, කවියට තමන්ගේ දර්ශනය පමණක ඇති පමණට කවන්නත් ඉටාගත්ත කෙනෙක්. නමුත් ඔහුට කවියෙන් ගැලවෙන්න පුළුවන් බහුතර අවස්ථා තිබ්බට අතොරක් පෙම් කවිවලදි ඔහුට කවියෙන් එළියට පැනගන්න වෙලාව මදිවෙනවා. මං ඒ දෙවර්ගයටම කැමතියි.

**අමිලානි**

## අරුණෝදය බොහෝ දුරය!

දැස් බැඳ තිස් පැයේ දෙතිස් වධ දී
ටයර් සෑයේ දවන්නට මොහොතකට පෙර
බීමත් සොල්දාදුවන්ගේ කනෙන් රිංගා පැනගතිමි.

උස් මිනී කඳු මතින්
ලේ ගංගා ගලන මව්බිමේ
මැටි පැලක වහං වී වෙසෙන්නෙමි.

නිදි නොමැති රාත්‍රියේ
සැඩ සුළං හමා විත්
තුරු සිරස් සිඳ දමයි
උපහාසය මුසු වූ
බකමුහුණු හඬ අප හට ඇසෙයි

එසඳ, සුවහසක් විරුන්ගේ
අභිමාන රණ ගීත
බලැති 'ආටානාටිය පිරිතක් වී ගැයෙයි

දෙනෙත් පියැවෙන විටදි යන්තමට
මැටි ගෙපැල වට කරන
රළු, බරැති පාවහන් හඬ ඇසෙයි
දිරාගිය දොර පළුව දෙපළු කර
වෙඩි උණ්ඩ හඹා එයි.
තිගැස්සී ඇහැරෙද්දි එක්වරම
මා අතුරුදන් වුණැයි මට හැඟෙයි

විදුලියක් සේ නැඟිට
පැදුර යට නිබඳ සැරසී සිටින
'ගල් කට්ටය' දෝතින් ගතිමි.

බොහෝ කලකින් නොදුටු
ඇතැම්විට කිසි දිනක හමු නොවනා
පෙම්වතිය සේ සෙනෙහසින්
සීතල යකඩ බටය තුරුලු වෙයි.

දොර විවර කර එළියට ඇවිත්
තියුණු ලෙස හාත්පස පිරික්සමි
කිසිවකු නැත!

රතු රෝස කැකුළකට කඳුළු පිනිකැට වෑ
උමතු වූ සුනඛයෙක් නොනැවතී උඩු බුරයි
ඈත අගාධය පතුලෙ ඇති
හුදෙකලා පැල්පතක පහන් එළියක් දිලෙයි

(1989 අග භාගයේ අතුරුදන් වී යැයි විශ්වාස කරන ලාංකේය තරුණ විප්ලවවාදීන් ඉංග්‍රීසි බසින් රචනා කරන ලද පද්‍යයක පරිවර්තනයයි.)

# ධනේශ්වර වැල්ලට බඹරු ඇවිත්



**1977 වසර යනු පත අට එකට සිඳුවා එක්සත් ජාතික පක්ෂය හයෙන් පහක අසීමිත පාර්ලිමේන්තු බලයක් ලබාගත් වසරක් ලෙසින් හඳුන්වාදිය හැකිය. ශ්‍රී ලංකාවට විවෘත ආර්ථිකයේ මාවත විවර වූයේ ජේ.ආර්. ජයවර්ධන ජනපතිවරයාගේ මූලිකත්වයෙනි.**

එමෙන්ම 1977 මැතිවරණයෙන් පසු සිදුවූ දේශපාලන පෙරළියත් සමඟ ලංකාවේ විවෘත ආර්ථිකය මුහු කර ගත් නව දේශපාලන සංස්කෘතියක පෙරළියක් සිදු වෙමින් පැවතිණි. එකී සමාජ වටපිටාවන් ද සමඟින් බඹරු ඇවිත් චිත්‍රපටය නිර්මාණය කිරීම උදෙසා පතිරාජයන් විෂය කරගනු ලැබුවේ ද වැනසෙමින් තිබූ මෙකී සමාජ වටපිටාවයි.

චිත්‍රපටයේ කතා වස්තුව ලියැවී තිබුණේ දුෂ්කර වූ ධීවර ගම්මානයක් මුල්කර ගනිමිනි. එකී කතා වස්තුවට අදාළව මෙකී ගමේ සියල්ලෝම සාමයෙන් එදිනෙදා ධීවර කටයුතු කරමින් තම ජීවිකාව ගෙන යමින් හුන් පිරිසක් වූහ. අතිමහත් වූ මුදල්මය ලාභයක් මුල් කර නොගනිමින් තම ජීවිකාව ගෙන යාම පිණිස ගමේ මාළු වෙළඳාමේ ප්‍රමුඛයා වී සිටියේ ඇන්ටන්ය. ඇන්ටන්ගේ චරිතය හා සම වැදුණේ ජෝ අබේවික්‍රමයි. ඇන්ටන් වටා ඔහුගේම පිරිසක් නිරන්තරයෙන් රැඳී සිටියේ තම සුළු වූ ව්‍යාපාරික කටයුතු වෙනුවෙනි. ධීවර ජීවිතය දුෂ්කර වුවද ඔවුන් තමනට ලැබෙන සොච්චම් මුදලින් තමන් දන්නා රැකියාව කරමින් සතුටින් ජීවත් වූහ.





මෙවන් සමාජ වටපිටාවක් පවතින කාල වකවානුවක නගරයෙන් ගමට සංක්‍රමණය වන්නේ ගමට කිසිසේත් නුහුරු වෙනම රටාවකින් යුතු වූ චරිතයකි. ඔහු වික්ටර් නොහොත් බේබි මහත්තයාය. වික්ටර්ගේ චරිතය හා සම්බන්ධ වන්නේ විජය කුමාරතුංගයි. කලබලකාරීත්වයෙන් තොර වූ වැල්ලට මුදල්මය සාධකය වඩා යහමින් රැගෙන එන්නට සමත් වන්නේ ඔහුය.

ධීවර ගම්මානයේ සිටියවුනට නුහුරු නුපුරුදු චරිත සමඟින් කිසිදු දිනක දැක නොමැති රට බීම, සිගරට් මෙන්ම ගැමියන්ට ආගන්තුක වූ ගිනිඅවි ආදිය ද මේ සමඟම ගමට අනවසරයෙන්ම ඇතුළු වන්නට විය. මේ සා භෞතික වස්තූන් හා ප්‍රාග්ධනයද සමඟින් වැල්ලට පැමිණි බේබි මහත්තයා තම අණසක සෙමෙන් වැල්ල පුරා පතුරන්නට පටන්ගත් මොහොතේ පටන් සටනක ආරම්භයක් ධීවර ගම්මානය තුළින්ම දිස්විය.

ඇන්ටන් යනු මෙකී ගම්මානයේ උප්පත්තිය ලබා, ධීවර රැකියාව කරමින් ගමේ සියල්ලන්ගේම හොඳ හිත දිනා ගත් ගමේ මාළු වෙළඳාමේ ආධිපත්‍යය පතුරුවා හැරි පුද්ගලයාය. මුලින්ම සටන අරඹන්නේ ඇන්ටන්ය.

වික්ටර් බේබි මහත්තයා, ඇන්ටන් සමඟ මාළු මිලට ගැනීමේ තරගයට පැමිණීමත් සමඟ ධීවර ගම්මානයේ සාමකාමී බව පලා යන්නට වැඩි කලක් ගත නොවීය. ආර්ථික ශක්තිය අතින් ඉහළින්ම සිටි බේබි මහත්තයාගේ ආධිපත්‍යය, අණසක ගම්මානය පුරාම විහිද ගියේ මුහුදු සුළං වැද විසිර යන දුහුවිලි වන් වැලි අහුරුවලටත් වඩා වැඩි වේගයකිනි. වැල්ලට සිටි සුරූපීම තරුණිය හෙලන්ය. ධීවර කර්මාන්තයට සම්බන්ධව වැඩ කටයුතු කළ හෙලන්ගේ චරිතය හා සම වැදුණේ මාලනී ෆොන්සේකාය. හෙලන් සමඟින් අලුත් ජීවිතයක් අපේක්ෂාවෙන් සිටි තරුණයා වූයේ සිරිල් නොහොත් සිරිල් වික්‍රමගේය. සිරිල්ගේ ප්‍රේමය පවා අහේතුක ලෙස බිඳ වැටෙන්නේ හෙලන්, බේබි මහත්තයාගේ ග්‍රහණයට හසුවීමත් සමඟය. දුහුවිලි කැකෑරෙන වැල්ලේ දී හෙම්බත්ව ප්‍රේමයක වෙළී හුන් හෙලන්, බේබි මහත්තයා සමඟ ආදර සම්බන්ධතාවක් අරඹන්නේ ඉසුරුමත් දිවියක බලාපොරොත්තු ගොන්නක්ද සමඟිනි.

සාමකාමීව ගලාගෙන ගිය ජීවිතවලට ලේ රත් කරන සිදුවීම්වලට මුහුණ දෙන්නට සිදුවූයේ වැල්ලට බඹරු පැමිණීමත් සමඟය.

"තෙරේසා, උඹලා ප්‍රවේශම් වෙයල්ලා, බඹරු ඇවිල්ලා, බඹරු"

ගමට පැමිණෙන ආගන්තුකයන් දකිද්දීම ඇන්ටන් එය කියන්නේ නිකමට නොවේ. කෙසේ වෙතත්, මෙහිදී සිදු වූ ගැටුම්වලින් මුලින්ම මිය යන්නේ හෙලන් සමඟ ප්‍රේමණීය ජීවිතයන් ගත කරන්නට අරඅදිමින් සිටි සිරිල්ය. දෙවනුව මිය යන්නේ බේබි මහත්තයා සමඟ කරට කර හැපෙන්නට ආ ඇන්ටන්ය. ඇන්ටන් වෙරි මරගාතේ සිටිද්දී ඔහුට මන්නයකින් පහර දෙන්නේ ෆ්‍රැන්සිස්ය. මේ චරිතයට පණ පොවනු ලැබුවේ දයා තෙන්නකෝන්ය. බේබි මහත්තයා වැල්ලට පැමිණීමට පෙර කාගෙ කාගේත් හිතහොඳ මිනිසා වූයේ ඇන්ටන්ය. ඇන්ටන්ගේ ඝාතනයත් සමඟ උරණ වූ ගම්මුන් ෆ්‍රැන්සිස්වද මරා දමන්නට කටයුතු කළෝය. සියලු දෑ අහවර වෙද්දී හෙලන් පමණක් බේබි මහත්තයා නිසා තමාට ලැබෙන්නට සිටි දරුවා සමඟින් හුදකලා වන්නට විය. මේ සියලු කරුණු කාරණා සිදුවෙමින් පවතිද්දී බේබි මහත්තයා අන් කවරෙකුගේ කෙසේ වෙතත් තමාගේ හිත සුව පිණිස පොලීසිය ගම තුළට කැඳවා ගෙන එන්නට සමත් විය. පොලීසියක් නොතිබූ ගමට පොලීසියක් ඇදී එන්නේ ඒ අයුරිනි.

දේශපාලනික බල තුලනය හුවමාරු වෙමින් පැවති කාල වකවානුවක ආවෘත ආර්ථිකය, විවෘත ආර්ථිකය කරා හුවමාරු වීමේ දී පතිරාජයන් මින් වුවද කීමට උත්සාහ කළේ මේ තාක් දුරට තිබූ සාමකාමී බව කඩා ඉහිරවා තැබූවේ ධනවාදී ආර්ථික ක්‍රමයේ ප්‍රතිඵල මත මිස අන් කවරක්වත් නිසා නොවන බවය. එමෙන්ම ගම හා නගරය අත පොවන මායිමක හෝ නොතිබූ මොහොතක ගමට පොලීසිය ඇදී එන්නේ ධනවාදී ආර්ථික ක්‍රමයක් නිසාම බිහිවූ බේබි මහත්තයා වැනි ධනවාදීන් ආරක්ෂා කිරීමට මිස හැල හොල්මනක්වත් නැතිව හුන් ගම්මුන්ගේ ආරක්ෂාවට නොවේ. එමෙන්ම තම පන්තිය තුළින්ම නැඟී එන විරෝධය දැක්වීමට පතිරාජයන් යොදාගනු ලැබූ චරිතය වූයේ වීරසේනය. වීරසේනට එය නිවැරදිව කියවා ගැනීමට හැකි වුවද ගම්මුන්ට එය වටහාගත හැකි ආකාරයට අවබෝධ කිරීමට ඔහු අසමත් විය. පතිරාජයන් එය මනාව පෙන්නුම් කරනු ලැබුවේ වීරසේන කතාව ආරම්භ කිරීමේදී සිටි ගම්මුන් කිහිපදෙනාද අවසානයේදී විසිර ගොස් එහි සිටින ගවයෙකු පමණක් රූප රාමු මඟින් පෙන්වීමෙනි.

එදා බඹරු ඇවිත් වනසා දැමූ වැල්ල අදටත් එසේමය. විවිධ සටකපටකම්, දූෂණ අක්‍රමිකතා, පුද්ගල ඝාතනයන් මැද ඒ ආකාරයෙන්ම ඉදිරියට දිව යනවා මිසක පසුපස හැරීමක් නම් සිදු වන්නේ නැත. නිසොල්මනේ ගලා ගිය ධීවර ගම්මානය බඹරුන් පැමිණ වනසා දැමුවේ ඒ අයුරිනි. ඒහෙත් බඹරුන් ඇවිත් ධනේශ්වර සුනාමියෙන් වනසා දැමූ වැල්ල වර්තමානය දෙස බලා සිටින්නේ සැනසුම් සයුරේ රළ නංවමිනි.

**රජිත බස්නායක**

- කවර නිර්මාණය
  **ගන්දික ධර්මබන්දු**
- පිටු සැකසුම
  **දීපාල් සංජීව සරත්මදු**

වර්ෂ 2024ක් වූ නොවැම්බර් මස 20 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.